ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය 581

රසායන විද්‍යා දෙපාර්තමේන්තුව

විද්‍යාවේදී/අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව/තනි විද්‍යා පාඨමාලාව

තුන්වන මට්ටම - අවසාන පරීක්ෂණය - **2007/2008**

**CHU 1221/CHE 4221** - රසායන විද්‍යාවේ මූලික සංකල්ප

**II** වන පත්‍රය

කාලය - පැය 02

---

දිනය - 2008 ජූනි 12 වේලාව - ප.ව. 1.30- ප.ව. 3.30

---

අපේක්ෂකයන් සඳහා උපදෙස් :

- දී ඇති ප්‍රශ්න 6 අතරින් ඕනෑම 4 කට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න 4 කට වඩා පිළිතුරු සපයා ඇති විටදී පිළිතුරු සපයා ඇති පිළිවෙලට මුල් පිළිතුරු 04 පමණක් අගයනු ලැබේ.
- පිළිතුරු දෙන සෑම ප්‍රශ්නයකට අංකය (ප්‍රශ්න පත්‍රයේ සඳහන් ආකාරයට) පිළිතුරු පත්‍රයේ වම් තීරුවේ ලියන්න.
- උත්තර පත්‍රය භාරදීමට පෙර විභාග අංකය, ප්‍රශ්න පත්‍රයේ නම සහ පිළිතුරු දී ඇති ප්‍රශ්නවල අංක මුල් පිටුවේ ලියන්න.

| | |
|---|---|
| සර්වත්‍ර වායු නියතය $(R)$ | $= 8.314\ J\ K^{-1}\ mol^{-1}$ |
| ඇවගාඩ්‍රෝ නියතය $(L)$ | $= 6.022 \times 10^{23}\ mol^{-1}$ |
| ෆැරඩේ නියතය $(F)$ | $= 96\ 500\ C\ mol^{-1}$ |
| ප්ලාන්ක් නියතය $(h)$ | $= 6.63 \times 10^{-34}\ J\ s$ |
| ආලෝකයේ ප්‍රවේගය $(c)$ | $= 3.00 \times 10^{8}\ m\ s^{-1}$ |
| ප්‍රෝටෝනයේ ආරෝපනය (e) | $= 1.602 \times 10^{-19}\ C$ |
| ඉලෙක්ට්‍රෝනයේ ආරෝපනය | $= 1.602 \times 10^{-19}\ C$ |
| රිඩ්බර්ග් නියතය $(R_H)$ | $= 1.097 \times 10^{7}\ m^{-1}$ |
| රික්තයේ පාරවිද්‍යුත් නියතය $\varepsilon_0$ | $= 8.854 \times 10^{-12}\ C^{2} N^{-1} m^{-2}$ |
| 1 eV | $= 1.602 \times 10^{-19}\ J$ |
| 1 bar | $= 10^{5}\ N\ m^{-2}$ |
| 1 a.m.u | $= 1.665 \times 10^{-27}\ kg$ |
| $\log_e (X)$ | $= 2.303 \log_{10} (X)$ |

---

01. **(a)** සෝඩියම් හි පරමාණුක වර්ණාවලියේ 589.0 **nm** හි දී සහ 599.6 **nm** හිදී පවතින දීප්තිමත් කහ රේඛාවන් දෙකක් දක්නට ලැබේ.

**(i)** ෆෝටෝනයකට **(photon)** වැඩි ශක්ති ප්‍රමාණයක් අඩංගු වන්නේ ඉහත රේඛා දෙකෙන් කුමන එකක ද?

**(ii)** ඉහත වැඩි ශක්තියක් ඇති රේඛාව 1.000 **kilowatt** $\mathbf{(1000\ Js)^{-1}}$ ප්‍රමාණයක විකිරණ ශක්තිය අඩංගු චාප ආලෝකයක් **(Arc light)** නිපදවීමට යොදා ගනී. මේ සඳහා, තත්පරයකදී ෆෝටෝන පිට කලයුතු සෝඩියම් පරමාණු මවුල ප්‍රමාණයක කොපමණ ද? (ලකුණු 20)

**(b)** හයිඩ්‍රජන් පරමාණුවේ ශක්ති මට්ටම් සඳහා වන බෝර් සමීකරණය, $He^{+}$ වැනි තනි ඉලෙක්ට්‍රෝන විශේෂ සඳහා යෙදීමේදී පහත ආකාරය වෙනස් වේ.

$$E_n = \frac{-kz^2}{n_i^2}$$

(i) z සහ n හඳුනා ගන්න.

(ii) $k = 2.179 \times 10^{-18} J$ වේ නම්, $He^{+}$ අයනයේ ඉලෙක්ට්‍රෝනයක් පිට කිරීමට අවශ්‍ය ශක්තිය ගණනය කරන්න.

(iii) ඉහත (ii) ක්‍රියාවලියට අදාල සමීකරණය ලියන්න.

(iv) බෝර් කක්ෂයක්, කාක්ෂිකයකින් වෙනස් වන්නේ කෙසේ ද?

(ලකුණු 30)

**(c)** පහත දැක්වෙන පරමාණු/අයන සඳහා ඉලෙක්ට්‍රෝනික වින්‍යාසය ලියන්න.

(i) $Cr^{3+}$ (ii) Fe (iii) $N^{3-}$

(සාපේක්ෂ පරමාණුක ස්කන්ධ Cr = 24 ; Fe = 26 ; N = 7 ) (ලකුණු 15)

**(d)** (i) ක්ලෝරයිඩ අයන ප්‍රතිශතය සෙවීම සඳහා, 25.00 $cm^3$ මුහුදු ජලය සාම්පලයක් සිල්වර් නයිට්‍රේට් සමග ප්‍රතික්‍රියා කර සිල්වර් ක්ලෝරයිඩ් අවක්ෂේප කිරීම කරන ලදී. අන්ත ලක්ෂය ලැබීමට 0.299 mol $dm^{-3}$ සිල්වර් නයිට්‍රේට් ද්‍රාවනයකින් 42.58 $cm^3$ අවශ්‍ය විය.
මුහුදු ජලයේ ඝනත්වය 1.025 g $cm^{-3}$ නම්, මුහුදු ජලයේ ඇති ක්ලෝරයිඩ අයන වල ස්කන්ධ ප්‍රතිශතය ගණනය කරන්න.

(ii) බැර ජලයෙහි, සබන්වල ක්‍රියාව අවහිර කරන $Ca^{2+}$ , $Mg^{2+}$ සහ $Fe^{2+}$ අයන අඩංගු වේ. ජල මෘදුකාරක (water softeners) මගින් මෙම අයන $Na^{+}$ අයන මගින් විස්ථාපනය කල හැක. $1.0 \times 10^3$ $dm^3$ බැර ජල ප්‍රමාණයක 0.010 mol $dm^{-3}$ $Ca^{2+}$ සහ 0.0050 mol $dm^{-3}$ $Mg^{2+}$ අයන ප්‍රමාණයක් අඩංගු වේ නම්, ඒවා විස්ථාපනය කිරීමට අවශ්‍ය $Na^{+}$ මවුල ප්‍රමාණය කොපමණ ද?

(ලකුණු 35)

02. **(a)** "අයනීකරණ විභවය" සහ "ඉලෙක්ට්‍රෝන බන්ධුතාවය" අර්ථ දක්වන්න.

**(b)** LiBr (s) සඳහා Born -Haber චක්‍රය අඳින්න. පහත දැක්වෙන දත්ත (kJ $mol^{-1}$) උපයෝගී කර ගනිමින් LiBr(s) හි දැලිස ශක්තිය ගණනය කරන්න.

| | | |
|---|---|---|
| ලිතියම්හි අයණීකරණ විභවය | = | 520 |
| ලිතියම්හි විලයන එන්තැල්පිය | = | 134.7 |
| $Br_2$ (*l*) හි වාෂ්පීකරණ එන්තැල්පිය | = | 15.46 |
| $Br_2$ (g) හි බන්ධන විඝටන ශක්තිය | = | 111.7 |
| Br හි ඉලෙක්ට්‍රෝන බන්ධුතාවය | = | - 324 |
| LiBr(s) හි සම්මත උත්පාදන එන්තැල්පිය | = | - 351.2 |

(ලකුණු 26)

**(c)** පහත දැක්වෙන ඒවායේ ලුවිස් ව්‍යුහයන් අඳින්න.

(i) $H_2S$ (ii) $SF_4$ (iii) $SF_6$ (S = 16)

ඒවායේ ජ්‍යාමිතිය පුරෝකථනය කරන්න. (ලකුණු 24)

**(d)** පහත දැක්වෙන පරමාණුක කාක්ෂිකයන් සම්බන්ධ වීමෙන් සෑදෙන අණුක කාක්ෂිකවල හැඩයයන් අඳින්න.

**(i)** s සහ s **(ii)** p සහ p (පරමාණු න්‍යෂ්ටි අතර අක්ෂය x ලෙස සලකන්න.)

**σ** හෝ **π** ලෙස ඒවා නම් කරන්න. ප්‍රති බන්ධන කාක්ෂික තරු ලකුණකින් (*) හඳුනා ගන්න.

(ලකුණු 30)

**(e)** $O_2$ සහ $O_2^+$ සඳහා අණුක කාක්ෂික ශක්ති රූප සටහන් අඳින්න.
එක් එක් විශේෂය සඳහා බන්ධන පෙල ගණනය කර චුම්බක ගුණයයන් සඳහන් කරන්න.

(ලකුණු 20)

03. **(a)** සිට **(f)** සඳහා සියළු කොටස්වලට පිළිතුරු සැපයීමට උත්සාහ කරන්න. කෙසේ වෙතත්, මුළු ලකුණු ලැබීමට නම් ප්‍රශ්නයට දී ඇති ලකුණු 120 න් ලකුණු 100 කට වඩා ලැබිය යුතුයි. අනිකුත් අයට **pro-rata** ක්‍රමයට ලකුණු ලැබෙනු ඇත.

**(a)** බොයිල් නියමය, චාල්ස් නියමය හා ඇවගාඩ්රෝ නියමය උපයෝගී කර ගනිමින්, වායු නියතය, **R** වායුවේ ස්වභාවයෙන් ස්වායත්ත බව පෙන්වන්න. (ලකුණු 20)

**(b)** වායු මවුලයක් සඳහා සම්පීඩ්‍යතා සාධකය **(Z)** පහත දැක්වෙන ආකාරයේ ප්‍රකාශයක් මගින් දෙනු ලබයි.

$$Z = (\text{නියතයක්})\left(\frac{\pi\phi}{\theta}\right)$$

**(i)** ඉහත සමීකරණයේ **θ** මගින් දැක්වෙන පදය හඳුනා ගන්න.

**(ii)** **ϕ** මගින් දැක්වෙන්නේ කුමක් ද?

**(iii)** ඉහත ප්‍රකාශය උපයෝගී කර ගනිමින් අනුරූප අවස්ථා පිළිබඳ නියමය **(law of corresponding states )** අපෝහනය කරන්න.

(ලකුණු 18)

**(c)** තාපගති විද්‍යාත්මකව අපෝහනය කල හැකි පහත දැක්වෙන ප්‍රකාශ යෙදිය හැක්කේ කුමන පද්ධති සඳහා කුමන තත්ව යටතේ ද?

$(i)\ \left(\frac{p_1}{p_2}\right)^{1-\gamma} = \left(\frac{T_2}{T_1}\right)^{\gamma}$ $(ii)\ U = H - PV$ $(iii)\ \Delta U = nC_{v,m}\Delta T$

(ලකුණු 16)

**(d)** ගණිතමය ප්‍රකාශයක් උපයෝගී කර ගනිමින් ද්‍රව්‍යයක "තාප ධාරිතාව" **C** අර්ථ දක්වන්න. තාප ධාරිතාව සංකල්පය යෙදිය හැක්කේ කුමන ආකාරයේ පද්ධතියක් සඳහා ද යන්න සඳහන් කරන්න.

(ලකුණු 14)

**(e)** **100 K** හිදී ඔක්සිජන් වායුව $\left(C_{p.m} = \frac{7R}{2}\right)$ සඳහා වර්ග මධ්‍යයන වේගය **(mean square speed)** ගණනය කරන්න.
(සාපේක්ෂ පරමාණුක ස්කන්ධය **O = 16**) (ලකුණු 24)

**(f)** අයිස් **100 moles** සම්මත වායුගෝල පීඩනයේදී හා එහි ද්‍රවාංකය වන **$0^oC$** හිදී සම්මත විලයන එන්තැල්පිය ($\Delta H_f^0$ **60 kJ mol$^{-1}$** තාප ප්‍රමාණයන් පිට කරමින් දියවේ. **$0^oC$** දී අයිස් සහ ජලය සඳහා මවුලික පරිමාව පිළිවෙලින් 20.0 සහ 18.0 **cm$^3$mol$^{-1}$** වේ. අයිස් දියවීමේ ක්‍රියාවලිය සඳහා

(i) කරන ලද කාර්ය ප්‍රමාණය
(ii) අභ්‍යන්තර ශක්තියේ වෙනස, **$\Delta U$**
(iii) ගිබ්ස් නිදහස් ශක්ති වෙනස, **$\Delta G$**
(iv) එන්ට්‍රොපි වෙනස **$\Delta S$**

ගණනය කරන්න.

04. **(A)** **(a)** අම්ල සහ භෂ්ම පිළිබඳ කාරනාත්මක අර්ථ දැක්වීම කුමක් ද?
**LiH, $SO_3$, HCN** සහ **$P_4O_{10}$** ඉහත අර්ථ දැක්වීමට අනුව වර්ගීකරණය කරන්න.

**(b)** ෆෝමික් අම්ලය **($HCO_2H$)** සඳහා ස්වයං අයනීකරණ ප්‍රතික්‍රියාව ලියන්න. ෆෝමික් අම්ලය, ජලයේ අයනීකරණය වීම සඳහා සමීකරණය ලියන්න.

**(c)** ආම්ලික මාධ්‍යයකදී ඩයික්‍රෝමේට් අයනය මගින් සල්ෆර් ඩයිඔක්සයිඩ්, සල්ෆේට් බවට ඔක්සිකරණය කිරීම සඳහා තුලිත සමීකරණය ලියන්න.

**(d)** **$Cd(s) + Pb^{2+}(aq) \longrightarrow Cd^{2+}(aq) + Pb(s)$**
කෝෂ ප්‍රතික්‍රියාව සඳහා **$E^0$** සහ **$\Delta G^0$** ගණනය කරන්න.
$E^0(cd^2+/cd) = -0.43V$ $E^0{}_{(pb^2/pb)} = -0.126V$

(ලකුණු 50)

**(B)** **(a)** ප්‍රතික්‍රියා වේගය සෙවීම සඳහා **A** සහ **B** අතර සිදුකල ප්‍රතික්‍රියාවකදී ප්‍රතික්‍රියාවේ මුළු පෙළ 2 බව සොයා ගන්නා ලදී.
**A** හා **B** අතර ප්‍රතික්‍රියාව සඳහා ලිවිය හැකි වේග ප්‍රකාශන සමීකරණ 3 ක් ලියන්න.

**(b)** කිසියම් දෙන ලද උෂ්ණත්වයකදී නයිට්‍රජන් මොනොක්සයිඩ් **NO** සහ **$H_2$** හයිඩ්‍රජන් අතර ප්‍රතික්‍රියාවේ වේගය පරීක්ෂාවට ලක් කරන ලදී. එහිදී ලැබුණු දත්තයන් පහත දැක්වේ.

| [NO]/mol dm$^{-3}$ | [$H_2$ ]/mol dm$^{-3}$ | වේගය/mol d $^{-3}$ ms$^{-1}$ |
|---|---|---|
| 1.0 | 1.0 | 0.02 |
| 1.0 | 3.0 | 0.06 |
| 3.0 | 1.0 | 0.18 |

(i) ඉහත දත්ත උපයෝගී කර ගනිමින් ප්‍රතික්‍රියාවේ වේග සමීකරණය අපෝහනය කරන්න.
(ii) ඉහත (i) පිළිතුර උපයෝගී කර ගනිමින් වේග නියතයේ අගය ගණනය කරන්න.

**(c)** උෂ්ණත්වය වැඩිවන විට ප්‍රතික්‍රියාවක වේගය වැඩි වනුයේ ඇයි දැයි පහදන්න.
උෂ්ණත්වයේ වැඩිවීම වේග නියතය මත කෙසේ බලපායිදැයි සඳහන් කරන්න.
(ලකුණු 50)

5. **(a)** පහත දැක්වෙන දෑ අර්ථ දක්වන ප්‍රකාශ ලියන්න.

**(i)** විද්‍යුත් ක්ෂේත්‍ර ප්‍රබලතාවය, **E**
**(ii)** අයනික සංචරණය, **U**
**(iii)** ආරෝපන ඝනත්වය, **J**
එමගින් ඒවාට අදාල SI ඒකක ලියන්න.

(ලකුණු 18)

**(b)** විද්‍යුත් විච්ඡේදනයේදී ඉලෙක්ට්‍රෝඩයක දී නිදහස් වන අයනයක ස්කන්ධය **(m)** ගණනය කිරීම සඳහා $m = \frac{QM}{ZF}$ ප්‍රකාශනය යොදා ගත හැක.

**(i)** ඉහත ප්‍රකාශනයේ අනිකුත් පද සියල්ල හඳුනා ගන්න.
**(ii)** විද්‍යුත් විච්ඡේදන පරීක්ෂණයක දී, ලෝහ අයන ද්‍රාවනයක් තුලින් මිනිත්තු 5 ක් තුල **10 mA** ධාරාවක් යැවීමෙන් **10 mg** ලෝහ ප්‍රමාණයක් තැන්පත් විය. ඉහත ලෝහ අයනයට අදාල ආරෝපන අංකය ගණනය කරන්න. (ලෝහයේ සාපේක්ෂ පරමාණුක ස්කන්ධය 96.5 ලෙස සලකන්න.)

(ලකුණු 20)

**(c)** විද්‍යුත් විච්ඡේද්‍යයක ජලයේදී මෞලික සන්නයනතාවය **(molar conductivity) 2.5 x $10^{-2}$ S $m^2$ $mol^{-1}$** වේ. ශිෂ්‍යයෙක් මෙම විද්‍යුත් විච්ඡේද්‍යයේ 500.00$cm^3$ ජලීය ද්‍රාවනයක් සෑදූ අතර එහි **5.00 x $10^{-2}$** මවුල ප්‍රමාණයක් අඩංගු විය.

**(i)** ද්‍රාවනයේ සාන්ද්‍රනය **mol $m^{-3}$** වලින් ගණනය කරන්න.
**(ii)** ද්‍රාවනයේ සන්නායකතාවය **(conductivity) S $cm^{-1}$** ඒකක වලින් ගණනය කරන්න.
(ජලය නිසා වන සන්නායකතාවය නොසලකා හරින්න.)

(ලකුණු 20)

**(d)** පහත සමීකරණය **1 : 1** විද්‍යුත් විච්ඡේද්‍ය සඳහා යෙදිය හැකි **Onsager** සීමාකාරී නියමයට අදාල වේ.

$$\Lambda = m\sqrt{c} + \Lambda_0$$

**(i)** 1 : 1 විද්‍යුත් විච්ඡේද්‍යයන් සඳහා උදාහරණයක් දෙන්න.
**(ii)** ඉහත සමීකරණයේ ඇති සියලු පද පැහැදිලිව හඳුනා ගන්න.
**(iii)** ශිෂ්‍යයෙක් ඉහත නියමය උපයෝගී කර ගනිමින් 1:1 විද්‍යුත් විච්ඡේද්‍යයන් සඳහා $\Lambda_o$ සෙවීමට අදහස් කරයි. එම පරීක්ෂණයේදී පිළිපැදිය යුතු පියවරවල් ලියන්න. (පරීක්ෂණාත්මක විස්තර අවශ්‍ය නැත.)
මෙම පරීක්ෂණයකදී ලැබිය හැකි ප්‍රස්ථාරයේ කටු සටහනක් අඳින්න.

**(iv)** **C = 0.0036 mol $dm^{-3}$** වන විට දී $\Lambda = p$ ද,
**C = 0.0025 mol $dm^{-3}$** වන විට දී $\Lambda = q$ ද නම් $\Lambda_o$ සඳහා බලාපොරොත්තු විය හැකි අගය **p** සහ **q** ( **p** සහ **q** අභිමතාර්ථ නියතයන් මගින් දේ ) මගින් ගණනය කරන්න.

(ලකුණු 42)

06. සියළු කොටස් සඳහා පිළිතුරු සපයන්න.

**(a)** පහත සංයෝග සඳහා **IUPAC** නම් දෙන්න.

i. 

ii. 

(ලකුණු 20)

**(b)** **(i)** **4-chloro-2-hydroxyhex - 4 -enal** හි ව්‍යුහය දෙන්න.

**(ii)** ඉහත සංයෝගය සඳහා ත්‍රිමාන සමාවයවික කොපමණ තිබිය හැකි ද?

**(iii)** **(2S,4Z) 4 - chloro-2-hydroxyhex-4-enal** සඳහා ව්‍යුහය අඳින්න.

(ලකුණු 20)

**(c)** පහත දැක්වෙන සංයෝගවල කයිරැල් කේන්ද්‍රයේ ත්‍රිමාන රසායනය (**R** හෝ **S** වශයෙන් ) සහ ද්විත්ව බන්ධනවල ත්‍රිමාන රසායනය (**E** හෝ **Z** වශයෙන්) නිර්ණය කරන්න.

i. 

ii. 

(ලකුණු 10)

**(d)** පහත දැක්වෙන **A** සංයෝගයේ සන්‍යාස අඳින්න. වඩා ස්ථායී වන්නේ කුමන සන්‍යාසය දැයි හේතු දක්වමින් සඳහන් කරන්න.



**A**

(ලකුණු 20)

**(e)** පහත දැක්වෙන සංයෝග යුගලයන්හි ඇති සංයෝග දෙක අතර ඇති ත්‍රිමාන රසායනික සම්බන්ධතාවය (ප්‍රතිරූප අවයවක, පාර ත්‍රිමාන හෝ සමාන) කුමක් ද?

i. 

ii. 

iii. 

(ලකුණු 30)

\- **හිමිකම ඇවිරිණි.** -